# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය.

**අභියාචනා අංක:- AAT/34/2022 (NPC)**

එස්.ඊ.ටී.ඩී.සමරනායක
**අභියාචක**

**එදිරිව,**
ජාතික පොලිස් කොමිෂන් සභාව
**වගඋත්තරකරු**

**දිනය : 2026.01.07**

| | | |
|---|---|---|
| **ඉදිරියේ දී** | **විනිසුරු කේ.ටී.චිත්‍රසිරි** | **(සභාපති)** |
| | **ජේ.ජේ.රත්නසිරි** | **(සාමාජික)** |
| | **එස්.නන්දසේකරන්** | **(සාමාජික)** |

පෙනී සිටීම :- අභියාචක සිටී.
අභියාචක වෙනුවෙන් නීතිඥ ඩී.එම්.පී. දිසානායක මහතා.
වගඋත්තරකාර ජාතික පොලිස් කොමිෂන් සභාව වෙනුවෙන් නියෝජ්‍ය අධ්‍යක්ෂ ආර්.එම්.එස්.පී.රත්නායක මහතා.

**-<u>නියෝගය</u>-**

සියළුම පාර්ශවකරුවන් ඉදිරිපත් කරන ලද කරුණුවලට සවන් දුනිමු. අභියාචක විසින් 2022.08.25 දිනැතිව ඉදිරිපත් කර ඇති අභියාචනා පෙත්සම මඟින් ඉල්ලා ඇත්තේ, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අභියාචක වෙත පනවා ඇති දඬුවම් ඉවත් කර, ඔහුට එරෙහිව ඉදිරිපත් කර තිබූ සියළුම චෝදනාවන්ට නිවැරදිකරු යැයි තීරණය කරන ලෙසයි. ඒ සමඟම ඔහු වෙත පනවා ඇති දඬුවම් ඉවත් කරන ලෙසද ඉල්ලා ඇත. ඉහත කී පරිදි අභියාචක වෙත ඉදිරිපත් කරන ලද චෝදනා වලට දඬුවම් පමුණුවා ඇත්තේ, ඔහු වෙත ඉදිරිපත් කරන ලද II සහ V යන චෝදනාවලට ඔහු වරදකරු බවට පත් කිරීම හේතුවෙනි. ඉහත කී II වන චෝදනාව අපකීර්තිදායක හැසිරීම වන අතර V වන චෝදනාව දූෂිත ක්‍රියා සිදු කිරීම යන්නයි. II චෝදනාවේ සාරාංශය වන්නේ, තිලක් ඩයස් සමරනායක යන අයගෙන් රුපියල් 3000 ක මුදලක් අභියාචක විසින් ලබාගැනීමෙන්, එනම් අනිසි ලෙස හෝ විනය පවත්වා ගැනීමට හානි වන

අන්දමින් හෝ, පොලිස් සේවයේ හොඳ නමට කැළැලක් විය හැකි අන්දමින් හෝ හැසිරීමයි. V වන චෝදනාවද එම සිද්ධිය මත ඉදිරිපත් කර ඇත. ඉහත කී අල්ලස් ගැනීමේ චෝදනාව සම්බන්ධයෙන් කොළඹ මහාධිකරණයේ නඩුවක් පවරා පවත්වා ගෙන ගොස් තිබූ හෙයින් එම නඩුවේදී අල්ලස් දුන්නා යැයි කියනු ලබන පුද්ගලයා විසින් ලබා දී ඇති සාක්ෂිවල පිටපතක් ඉදිරිපත් කරන ලෙසට අභියාචකට දැනුම් දෙන ලදී. ඒ අනුව ඔහු විසින් එම පැමිණිලිකාර පුද්ගලයා වන, කේ.එම්.රත්න බණ්ඩාර යන අය විසින් මහාධිකරණය ඉදිරියේ ලබා දී තිබූ සාක්ෂිවල පිටපතක් ඉදිරිපත් කර ඇත. එම සාක්ෂිවලට විනිශ්චය අධිකාරයේ අවධානය යොමු කරන ලදී.

එහිදී එම සාක්ෂිකරු වන බණ්ඩාර යන අය පවසා ඇත්තේ, විත්ති කූඩුවේ සිටින සාජන් මහත්තයාට සල්ලි දුන්නා යනුවෙනි. මෙම සාක්ෂිකරුගෙන් දීර්ඝ ලෙස හරස් ප්‍රශ්නද අසා ඇත. එම හරස් ප්‍රශ්නවලට පිළිතුරු දුන් සාක්ෂිකරු පවසා ඇත්තේ, මෙම මුදල අල්ලසක් ලෙස අභියාචක විසින් ලබා ගත් බවයි. ඒ සම්බන්ධයෙන්, ඔහු විසින් දීර්ඝ වශයෙන් පැහැදිළිව සාක්ෂි ඉදිරිපත් කර ඇත. එසේ ලබා දී ඇති සාක්ෂිය මෙම විනිශ්චය අධිකාරය මඟින් සැලකිල්ලට නොගෙන සිටීමට නොහැකිය. ඒ අනුව එහිදී අභියාචක විසින් රුපියල් 3000 ක මුදලක් අල්ලසක් ලෙස ලබා ගත් බවට පැහැදිළි සාක්ෂි ඉදිරිපත් වී ඇති බව පැහැදිළි වේ.

මේ අවස්ථාවේදී මහාධිකරණය විසින් ප්‍රකාශ කර ඇති තීන්දුවටද අධිකරණයේ අවධානය යොමු කරන ලදී. එකී තීන්දුව අනුව අභියාචකයට විරුද්ධව ඉදිරිපත් කරනු ලැබූ අල්ලස් චෝදනා වලින් ඔහුව නිදහස් කර ඇත. ඒසේ නිදහස් කර ඇත්තේ, අභියාචක විසින් මුදල් ලබා ගැනීමට හේතුවූ කරුණු සහ මුල් පැමිණිලිකරුට එරෙහිව රථවාහන චෝදනාවක් සම්බන්ධයෙන් නඩුවක් පැවරීම, යන කරුණු මහාධිකරණය විසින් සංසන්දනය කිරීමෙන් පසුව ඇති වූ සැකයක් හේතුවෙනි. කෙසේ නමුත් මෙම විනිශ්චය අධිකාරය ඉදිරියේ පවතින අභියාචනයකදී ඉහත කී අපරාධ නඩුවේදී බලාපොරොත්තු වන අන්දමේ, ඉහළ තත්ත්වයකින් නඩුව ඔප්පු කිරීමේ අවශ්‍යතාවය පැන නගින්නේ නැත.

ඉහත කරුණු සලකා බැලීමේදී පැහැදිළිව පෙනී යන්නේ, බණ්ඩාර යන අයගේ සාක්ෂිය මඟින් මෙම අභියාචක අල්ලස් මුදලක් ලබා ගත් බවට කරුණු

පැහැදිළිව ඉදිරිපත් වන බවයි. විධිමත් විනය පරීක්ෂණයේදී එම සාක්ෂිකරුවන් සාක්ෂි දීම සඳහා පැමිණ නැත. එබැවින් එම තත්ත්වය එහිදී හෙළිදරව් වීමට අවස්ථාව ලැබී නැත. නමුත් අධිකරණය දී ඇති සාක්ෂි නොසළකා හැරීමට මෙම විනිශ්චය අධිකාරයට හැකියාවක් නැත. එම කරුණු සළකා බලා, පොලිස් කොමිෂන් සභාවේ තීරණය සම්බන්ධයෙන් මැදිහත්වීමට විනිශ්චය අධිකාරය කැමැත්තක් දක්වන්නේ නැත. ඒ අනුව පොලිස් කොමිෂන් සභාවේ තීරණය ඒ ආකාරයෙන්ම පැවැත්විය යුතු බවට වැඩිදුරටත් තීරණය කරමු. ඉහත හේතූන් සළකා බලා අභියාචකගේ අභියාචනය නිෂ්ප්‍රභා කිරීමට තීරණය කරමු.

අභියාචනය නිෂ්ප්‍රභා කරමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි.

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි.

එස්.නන්දසේකරන්
(සාමාජික)

දෙව්මිනි/